# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2363/88 - 2023 දෙසැම්බර් මස 23 වැනි සෙනසුරාදා - 2023.12.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ශුද්ධි පත්‍රයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : KDS/HAR/4/2/1/51.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අංකය : 4-3/9/2017/WS/589.

2023 මැයි මස 19 දිනැති අංක 2332/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද 7 වැනි වගන්තිය දැන්වීමේ ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් "2023 ජූලි මස 19 වැනි දින පෙ.ව. 10.00 ට" හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි යනුවෙන් සඳහන් වී ඇත. එහි සඳහන් දිනය සහ වේලාව 2024.02.21 දින පෙ.ව. 10.00 ට යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

මොහාන් ධර්මදාස,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2023 දෙසැම්බර් මස 15 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය

EOG 12-0367

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය :* 4-3/9/2014/WS/233.
*ප්‍රා.ලේ. යොමු අංකය:* KMB/LAN/ACQUI/02/60.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 317 B කරගොඩ උයන්ගොඩ 1 අත නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කැඩැස්තර සිතියම් අංක 820244 හි කලාප අංකය 3, පත්‍ර අංකය 1 හි පෙන්නුම් කරන පහත සඳහන් ඉඩම් කොටස:

**01. කැබලි අංක 1**
ඉඩමේ නම: නුගේහේන *නොහොත්* අලුත් දෙනියෙකනත්ත; විස්තරය: ගෙවත්ත ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; මුල් හිමිකම් කියන අය: අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය සහ සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.0253.

1A : G 041116 – 19 (12/2023)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත සඳහන් * ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024.02.12 වැනි දින පෙ.ව.9.30 ට කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2024.02.05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2023 දෙසැම්බර් මස 20 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 12-0368

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.